ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2488/02 - 2026 මැයි මස 11 වැනි සඳුදා - 2026.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

රේගු නිවේදනය

(235 වැනි අධිකාරිය වන) රේගු ආඥාපනතේ 101 වැනි වගන්තිය යටතේවන නියෝග

සංශෝධිත (235 වැනි අධිකාරිය වන) රේගු ආඥාපනතේ 101.(1) (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මා විසින් පහත නියෝග ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 මැයි මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

නියෝග

මූලික කරුණු

1. මෙම නියෝග "භාණ්ඩ වර්ගීකරණය, ප්‍රභවස්ථාන රීති (ආනයන) සහ රේගු මිල පිරික්සුම් සම්බන්ධිත රේගු පෙරගත නියමයන් පිළිබඳ නියෝග 01/2026" වශයෙන් හැඳින්විය හැකි අතර, "භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධිත රේගු පෙරගත නියමයන් පිළිබඳ නියෝග 01/2024" අවලංගු කරමින් 2026.05.12 දින සිට බලාත්මක වේ.

2. ශ්‍රී ලංකාවේ තීරුබදු පැනවීම් තීරණය කිරීම සඳහා අදාළ වන භාණ්ඩ වර්ගීකරණය, ප්‍රභවස්ථාන රීති (ආනයන) සහ රේගු මිල පිරික්සුම්වල ගැටලු සම්බන්ධයෙන් වන රේගු පෙරගත නියමයන්වලට අදාළ සියලුම කරුණු මෙම නියෝග මගින් පාලනය විය යුතු ය.

1A - G 46845 — 33 (2026/05)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. භාණ්ඩ වර්ගීකරණය, ප්‍රභවස්ථාන රට (ආනයන) නිශ්චය කිරීම, සහ අනුකූල රේගු මිල පිරික්සුම් මූලධර්ම නිශ්චිතව දැනගැනීම සම්බන්ධිත රේගු පෙරගත නියමයන් යන්නෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවෙකු විසින් අවශ්‍ය කරන තොරතුරු සහ ලේඛනවලින් සනාථ කරමින් නියමිත ආකෘතියක් හරහා ඉදිරිපත් කරන අයදුම්පත්‍රයක් ඔස්සේ ඉදිරිපත් කරනු ලබන නිශ්චිත ප්‍රශ්න සඳහා ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත් කරන ලිඛිත තීරණයක් අදහස් කෙරේ.

4. සුදුසුකම් ලබන අයදුම්කරුවෙකු විසින් රේගු පෙරගත නියමයන් සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ප්‍රශ්න ආනයන හෝ අපනයන ගනුදෙනුවට පෙර ඉදිරිපත් කළ යුතු අතර, මීට පහත කරුණු අදාළ විය හැකි ය;

(i) තීරුබදු නාමකරණය තුළ භාණ්ඩ/ වෙළඳ භාණ්ඩ වර්ගීකරණය වන ආකාරය, හෝ

(ii) මෙම *ගැසට්* පත්‍රයේ දිනයෙන් පසුව ශ්‍රී ලංකා රජය විසින් එළැඹි ඕනෑම වෙළඳ ගිවිසුමක් යටතේ, සහ දැනට ක්‍රියාත්මක වන වෙළඳ ගිවිසුම්වලට අදාළව එවැනි ගිවිසුම්වල පාර්ශවකරුවන්ගේ අන්‍යෝන්‍ය එකඟතාවය මත පමණක් වරණීය තීරුබදු පැනවීම් අපේක්ෂාවෙන් ආනයනය කළහැකි භාණ්ඩවල ප්‍රභවස්ථාන, හෝ

(iii) භාණ්ඩවල රේගු වටිනාකම තීරණය කිරීම සඳහා වන රේගු මිල පිරික්සුම් මූලධර්ම.

5. රේගු පෙරගත නියමයක් සඳහා වන අයදුම්පතක් දැනටමත් ආනයනය කරනු ලැබ ඇති නිශ්චිත ආනයනික භාණ්ඩ තොගයක රේගු වටිනාකම තීරණය කිරීම සඳහා යොදා නොගත යුතු ය. රේගු මිල පිරික්සුම් මූලධර්ම පිළිබඳ අර්ථ නිරූපණය සහ අදාළත්වයට සහ ආනයනය කිරීමට පෙර භාණ්ඩවල රේගු වටිනාකම සඳහා අදාළ රීතිවලට පමණක් මිල පිරික්සුම් පිළිබඳ රේගු පෙරගත නියමයන් දැඩිව සීමා විය යුතු ය.

රේගු පෙරගත නියමයන් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්

6. වලංගු වන බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් (TIN) සහිතව ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති ඕනෑම ආනයනකරුවෙකු, අපනයනකරුවෙකු හෝ නිෂ්පාදකයෙකු හෝ සාධාරණ හේතුවක් සහිත දේශීය හෝ විදේශීය ඕනෑම පුද්ගලයෙකු හෝ අස්තිත්වයක් (මෙහි මින්මතු ''සුදුසුකම් ලබන අයදුම්කරු'' වශයෙන් හැඳින්වෙන) විසින් සෘජුවම හෝ බලයලත් නියෝජිතයෙකු හරහා හෝ මෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරමින් මෙම නියෝග යටතේ රේගු පෙරගත නියමයන් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

7. ඉහත 6 නියෝගයේ:

(i) ''සාධාරණ හේතුවක් සහිත දේශීය හෝ විදේශීය ඕනෑම පුද්ගලයෙකු හෝ අස්තිත්වයක්'' යන්නෙන් භාණ්ඩ අපනයනය හෝ ආනයනය කිරීමේ නියැලී සිටින හෝ නියැලීමට අපේක්ෂා කරන, එවැනි අභිප්‍රායක් පිළිබිඹු වන සාධාරණ සාක්ෂි සහිත ඕනෑම පුද්ගලයෙකු හෝ අස්තිත්වයක් (විදේශ අස්තිත්වයන් ද ඇතුළුව) අදහස් වේ.

(ii) මෙහි ''නියෝජිත''යන්නෙන් අදහස් වනුයේ:

(අ) ශ්‍රී ලංකා රේගුවේ ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී රේගු මූලස්ථාන අනුනියෝජිතයෙකු(CHA);

(ආ) වලංගුවන බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් (TIN) සහිතව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නීති සමාගමක් හෝ නීති වෘත්තිකයෙකු; හෝ

(ඇ) වලංගුවන බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් (TIN) සහිතව ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති වෙනත් ඕනෑම ව්‍යාපාරික අස්තිත්වයකි.

8. නියෝජිතයෙකු හරහා රේගු පෙරගත නියමයන් ලබා ගැනීමට අපේක්ෂා කරන සුදුසුකම් ලබන අයදුම්කරුවෙකු විසින් අයදුම්කරුට යම් සම්බන්ධතාවයක් තිබේ නම් එය ද ඇතුළුව නියෝජිතගේ විස්තර ලබාදෙමින් විශේෂිත සේවා අංශයේ රේගු අධ්‍යක්ෂ වෙත යොමුකරනු ලබන බලය පැවරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය. රේගු පෙරගත නියමයන් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රයේ කොටසක් ලෙස පවතින තොරතුරුවල නිරවද්‍යතාවය සහ ඉදිරිපත් කරනු ලබන ලේඛන සහ ලබා දෙන ප්‍රකාශවල වලංගුභාවය පිළිබඳව අයදුම්කරු සහ බලයලත් නියෝජිත යන දෙදෙනාම වගකිව යුතු ය.

රේගු පෙරගත නියමයන් ලබාගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීම

9. භාණ්ඩ වර්ගීකරණය, ප්‍රභවස්ථාන රීති (ආනයන) හෝ රේගු මිල පිරික්සුම්වලට අදාළ ගැටලු සඳහා පෙරගත රේගු නියමයන් ලබාගැනීමට අපේක්ෂා කරන සුදුසුකම් ලැබූ අයදුම්කරුවෙකු හෝ ඒ සඳහා, බලයලත් නියෝජිතයෙකු විසින් මෙම නියෝග සඳහා

උපලේඛනය I, උපලේඛනය II සහ උපලේඛනය III වශයෙන් දක්වා ඇති ආකෘති අතුරින් අවස්ථාවෝචිත පරිදි අනුකූලවන අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

10. රේගු පෙරගත නියමයන් ලබාගැනීම සඳහා වන අයදුම්පතක් නියම කරනු ලැබූ ආකෘතියේ සහ ආකාරය අනුව එය සනාථ කළ හැකි ලේඛන සහ හැකි නම්, අදාළ නියමය ලබාගැනීම අපේක්ෂා කරන භාණ්ඩයේ සාම්පල ද සමඟින් රේගු අධ්‍යක්ෂ, විශේෂිත සේවා අංශය, 3 වැනි මහල, ශ්‍රී ලංකා රේගුව, අංක 40, කෙළින් වීදිය, කොළඹ 11 වෙත ඉදිරිපත් කළ යුතු ය.

භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධිත රේගු පෙරගත නියමයක් ලබාගැනීම සඳහා අයදුම්පත

11. භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ රේගු පෙරගත නියමයක් ලබාගැනීම සඳහා අයදුම්පත;

(i) මෙම නියෝග සඳහා වන උපලේඛන I හි නිශ්චිතව දක්වා ඇති ARCC-01 ආකෘතිය යොදා ගනිමින් සකස් කළ යුතු ය,

(ii) භාණ්ඩ වර්ගීකරණය සඳහා සුදුසු යැයි හැඟෙන සංයෝජිත වර්ගීකරණ (HS) කේත දැක්වීම සිදුකළ හැකි අතර, ඉන් අනතුරුව එම කේතයන් අතුරින් එක් කේතයක් වඩාත් අදාළ බව සනාථ කිරීම සඳහා තර්ක ඉදිරිපත් කළ යුතු ය,

(iii) වර්ගීකරණය වන භාණ්ඩය නිසි පරිදි හඳුනාගැනීම සහ එහි නිරවද්‍ය වර්ගීකරණය නිශ්චය කිරීම සඳහා උපකාරී වන අවශ්‍ය මාර්ගගත ද්‍රව්‍ය ද ඇතුළත්ව, අවශ්‍ය නියැදි, මූලාකෘති, ත්‍රිමාණ ආකෘති, ඡායාරූප, නාමාවලි/ විස්තර පත්‍රිකා, නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු, ප්‍රතීතන ලත් රසායනාගාර විසින් නිකුත් කළ විශ්ලේෂණ වාර්තා, තාක්ෂණික දත්ත පත්‍රිකා, නිෂ්පාදන කාර්ය සඳහා වූ යන්ත්‍ර සූත්‍රාගාරවල වාර්තා, අන්තර්ගත අමුද්‍රව්‍ය/ ද්‍රව්‍යවල ලැයිස්තු, නිෂ්පාදන ක්‍රියාවලිය විස්තර කෙරෙන රූපසටහන් හෝ ද්‍රව්‍ය සඳහා වන පිරිසැකසුම් ක්‍රියාවලිය සහ වෙනත් ඕනෑම ලේඛනවලින් තහවුරු කිරීමක් හැකි අවස්ථාවන්හි දී සිදුකළ හැකි ය,

(iv) ලෝක රේගු සංවිධානය (WCO) විසින් නිකුත් කරන ලද ඕනෑම වර්ගීකරණ මාර්ගෝපදේශයකින් ද තහවුරු කිරීමක් ලබාගත හැකි ය.

12. සියලු තහවුරු කිරීමේ ලේඛන සහ ද්‍රව්‍ය අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු අතර, ''තහවුරු කිරීමේ ලේඛන සහ ද්‍රව්‍ය'' මැයෙන් නම් කළ වෙනමම පත්‍රිකාවක ඒවා විධිමත්ව ලැයිස්තු ගත කළ යුතු ය. ඉදිරිපත් කරනු ලබන එවැනි සියලු ලේඛන සහ ද්‍රව්‍යවල නිරවද්‍යතාවය සහ සත්‍යභාවය පිළිබඳ පූර්ණ සහ තනි වගකීම අයදුම්කරු සහ/හෝ නිසි ලෙස බලයලත් නියෝජිතයා විසින් දැරිය යුතු ය.

13. වෙන වෙනස් වෙළඳ භාණ්ඩයක් සඳහා වර්ගීකරණය පිළිබඳ නියමයක් අපේක්ෂා කිරීමක දී වෙනම අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද, සැලකිල්ලට ගනු ලබන වෙළඳ භාණ්ඩයේ තීරුබදු වර්ගීකරණය (HS Code) නිශ්චය කිරීම සඳහා ආදළ නොවන ආකෘති අංකය, ප්‍රමාණය ආදිය වැනි වෙනස්කම් සහිත භාණ්ඩයකට අදාළව නියමයක් අපේක්ෂා කරන අවස්ථාවක දී තනි අයදුම්පතක් ප්‍රමාණවත් වේ.

ප්‍රභවස්ථාන රීතී (ආනයන) සම්බන්ධිත රේගු පෙරගත නියමයක් සඳහා අයදුම්පත්‍රය

14. ප්‍රභවස්ථාන (ආනයන) සම්බන්ධිත රේගු පෙරගත නියමයන් සඳහා අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී;

(i) මෙම රෙගුලාසිවල උපලේඛන II යටතේ නිශ්චිතව දක්වා ඇති ARRO-01 ආකෘතිය භාවිත කළ යුතු අතර,

(ii) 4 (ii) රෙගුලාසියේ විධිවිධානවලට යටත්ව, නිශ්චය කිරීම අපේක්ෂා කරනුයේ කුමන නිශ්චිත වෙළඳ ගිවිසුමක් යටතේ ද යන්න පිළිබඳව යොමු දැක්වීමක් කළ යුතු ය.

15. භාණ්ඩවල තීරුබදු වර්ගීකරණය ද සඳහන් කරමින්, භාණ්ඩවල ප්‍රභවස්ථානය නිර්ණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි අදාළ ගිවිසුමේ නිශ්චිත රීතිය (රීති ද) අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ය.

උදාහරණයක් වශයෙන් ආනයනය කිරීමට යෝජිත භාණ්ඩය වරණීය වෙළඳ ගිවිසුමක් යටතේ ගෙන්වීමට සුදුසුකම් ලබන්නේ ද යන්න සම්බන්ධයෙන් නියමයක් ලබාගැනීමට අයදුම්කරුවෙකු විසින් අපේක්ෂා කෙරේ නම්, අදාළ වන ප්‍රභවස්ථාන නිර්ණායකය සහ එවැනි නියමයක් ලබාගැනීම සඳහා අදාළ වන ගිවිසුමේ අදාළ වන විධිවිධාන අයදුම්පතෙහි නිශ්චිතව දැක්වීම සිදුකළ යුතු ය.

16. විවිධ භාණ්ඩයන්ගේ ප්‍රභවස්ථානය නිර්ණය කරගැනීමට අදාළව වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

17. භාණ්ඩ මූලාරම්භ වන රටෙහි අනුමත බලාධිකාරියක් විසින් නිකුත් කරන ප්‍රභවස්ථාන සහතිකයක් මගින් අයදුම්පත සඳහා තහවුරුවක් ලැබිය හැකි අතර, එකී ප්‍රභවස්ථාන සහතිකය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්කරු සතුව පවතින ලේඛන ද ඒ සමඟ ඉදිරිපත් කළ යුතු ය.

18. ප්‍රභවස්ථාන රට වශයෙන් හිමිකම් ඉල්ලන රටෙහි සිදුකළ අවශ්‍ය නියැදි, මූලාකෘති, ත්‍රිමාණ ආකෘති, ඡායාරූප, නාමාවලි/ විස්තර පත්‍රිකා, නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු, ප්‍රතීතන ලත් රසායනාගාර විසින් නිකුත් කළ විශ්ලේෂණ වාර්තා, තාක්ෂණික දත්ත පත්‍රිකා, නිෂ්පාදන කාර්ය සඳහා වූ යන්ත්‍රසූත්‍රාගාරවල වාර්තා, අන්තර්ගත අමුද්‍රව්‍ය/ ද්‍රව්‍යවල ලැයිස්තු, නිෂ්පාදන ක්‍රියාවලිය විස්තර කෙරෙන රූපසටහන් හෝ ද්‍රව්‍ය සඳහා වන පිරිසැකසුම් ක්‍රියාවලිය සහ වෙනත් ඕනෑම ලේඛනයක් මගින් අයදුම්පත තහවුරු කළ යුතු ය.

19. ප්‍රභවස්ථාන නිර්ණය කිරීම අපේක්ෂා කරනුයේ ප්‍රභවස්ථාන නිර්ණායක යටතේ පූර්ණ වශයෙන් ලබාගන්නා නිෂ්පාදනයන් සඳහා නොවේ නම්, අයදුම්පත්‍රයේ (අ) අදාළ භාණ්ඩවල නැව්ගත කිරීම දක්වා වන වියදම් (FOB), (ආ) ප්‍රභවස්ථාන නොවන ද්‍රව්‍යවල වටිනාකම (VNM), සහ (ඇ) අදාළ ප්‍රභවස්ථාන නිර්ණය කිරීමේ රීති සමඟ අනුකූලතාවය නිර්ණය කිරීම සඳහා අදාළ වෙනත් ඕනෑම දත්ත ද සම්බන්ධයෙන් සහතික කළ දත්ත ඉදිරිපත් කළ යුතු ය.

20. සියලු තහවුරු කිරීමේ ලේඛන සහ ද්‍රව්‍ය අයදුම්පත සමඟ යොමුකළ යුතු අතර, "තහවුරු කිරීමේ ලේඛන සහ ද්‍රව්‍ය" වශයෙන් නම් කරන ලද වෙනම පත්‍රිකාවක විධිමත්ව නම් කළ යුතු ය. එවැනි ඉදිරිපත් කරනු ලබන සියලුම ලේඛන සහ ද්‍රව්‍යවල නිරවද්‍යතාවය සහ වලංගුභාවය සම්බන්ධයෙන් අයදුම්කරු සහ/හෝ නිසි ලෙස බලයලත් නියෝජිත විසින් පූර්ණ සහ තනි වගකීම දැරිය යුතු ය.

මිල පිරික්සුම් සම්බන්ධිත රේගු පෙරගත නියමයන් සඳහා අයදුම්පත

21. මෙම නියෝග සඳහා වන උපලේඛන III හි දක්වා ඇති ARCV-01 ආකෘතිය භාවිත කරමින් මිල පිරික්සුම් සම්බන්ධිත රේගු පෙරගත නියමයන් සඳහා වන අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

22. අදාළ ලේඛනමය සාක්ෂි මගින් තහවුරු කිරීමක් සහිතව සත්‍ය හෝ පැහැදිලිව සලකා බැලූ ආනයන ගනුදෙනුවකින් පැන නඟින එක් නිශ්චිත මිල පිරික්සුම් ගැටලුවකට එක් අයදුම්පතක් අදාළ විය යුතු ය.

23. පැහැදිලි එක් එක් මිල පිරික්සුම් ගැටලු සඳහා වෙන් වෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද, තනි විකුණුම් - මිල දී ගැනුමක දී හෝ ගිවිසුම්ගත ගනුදෙනුවකින් පැන නඟින බහු මිල පිරික්සුම් ගැටලු, මෙම නියෝගවල කාර්යය සඳහා තනි මිල පිරික්සුම් ගැටලුවක් ලෙස සැලකිය යුතු ය.

24. ගැටලුව උපකල්පනය කළ, ශාස්ත්‍රීය හෝ *නැතහොත්* අව්‍යාජ හෝ සැලසුම් කළ ආනයන ගනුදෙනුවකට අදාළ නොවේ නම් මිල පිරික්සුම් සම්බන්ධිත රේගු පෙරගත නියමයක් අපේක්ෂා කරන අයදුම්පත් සලකා නොබැලිය යුතු ය.

25. (235 වැනි අධිකාරිය වන) රේගු ආඥාපනතේ ඉ උපලේඛනය, සම්මත කර ඇති පරිදි ලෝක වෙළඳ සංවිධානයේ (WTO) රේගු මිල පිරික්සුම් ගිවිසුම, සහ අදාළ වන මිල පිරික්සුම් රීති සහ රෙගුලාසිවලට අනුකූල වන කරුණුවලට අදාළව මිල පිරික්සුම් සම්බන්ධිත රේගු පෙරගත නියමයන් ඉල්ලා සිටිය හැකි ය.

26. ගනුදෙනුව පිළිබඳ කරුණු සනාථ කිරීම සඳහා අදාළ සියලු ලේඛන අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු අතර, ඊට පහත ලේඛන ඇතුළත්වන නමුත්, ඒවාට පමණක් සීමා නොවිය යුතු ය:

(i) විකුණුම් හෝ මිල දී ගැනුම් කොන්ත්‍රාත්තු;
(ii) ඉන්වොයිසිය/ ඉන්වොයිස් (තිබේ නම්);
(iii) කර්තෘ භාගය හෝ බලපත්‍ර ගිවිසුම්;
(iv) බෙදාහැරීම්, අනුයෝජිත, හෝ ආශ්‍රිත පාර්ශව ගිවිසුම්;
(v) කොමිස් හෝ තැරැව්කාර ගිවිසුම්;
(vi) ප්‍රවාහන සහ රක්ෂණ ලේඛන;
(vii) අත්තිකාරම් ගෙවීම් ඇතුළුව ගෙවීම් තහවුරු කිරීම සඳහා සාක්ෂි;
(viii) පිරිවැය ප්‍රකාශ සහ ගිණුම් වාර්තා, අදාළ වන පරිදි; සහ
(ix) මිල පිරික්සුම් ගැටලු පැන නැඟීමට අදාළ වෙනත් යම් ලේඛනයක්.

27. සියලු තහවුරු කිරීමේ ලේඛන සහ ද්‍රව්‍ය අයදුම්පත සමඟ යොමුකළ යුතු අතර, "තහවුරු කිරීමේ ලේඛන සහ ද්‍රව්‍ය" වශයෙන් නම් කළ වෙනම පත්‍රිකාවක විධිමත්ව නම් කළ යුතු අතර එවැනි ඉදිරිපත් කරනු ලබන සියලුම ලේඛන සහ ද්‍රව්‍යවල නිරවද්‍යතාවය, වලංගුභාවය සහ සම්පූර්ණබව සම්බන්ධයෙන් අයදුම්කරු සහ/හෝ බලයලත් නියෝජිත විසින් පූර්ණ සහ තනි වගකීම දැරිය යුතු ය.

රේගු පෙරගත නියමයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ නිකුත් කිරීම

28. රේගු පෙරගත නියමයන් සඳහා විශේෂිත සේවා අංශයේ රේගු අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කෙරෙන අයදුම්පත්, පෙරගත නියමයක් අපේක්ෂා කරනුයේ කුමන ගැටලුවක් සම්බන්ධයෙන් මත පදනම්ව, ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් කටයුතු සිදුකිරීම සඳහා පහත දැක්වෙන පරිදි අදාළ අංශ වෙත යොමුකළ යුතු ය:

(i) වෙළඳ භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධිත කටයුතු විශේෂිත සේවා අංශය විසිනි.

(ii) ප්‍රභවස්ථාන රීති (ආනයන) සම්බන්ධිත කටයුතු ප්‍රකාශන අංශය විසිනි.

(iii) මිල පිරික්සුම් පිළිබඳ සම්බන්ධිත කටයුතු මධ්‍යම මිල පිරික්සුම් අංශය විසිනි.

පොදු

29. අයදුම්පතෙහි අනුකූලතාවය සහ පිළිගත හැකි බව නිර්ණය කිරීම පිණිස විශේෂිත සේවා අංශය විසින් තාවකාලික වශයෙන් අයදුම්පත පරීක්ෂා කළ යුතු අතර, එවැනි අයදුම්පතක් ලැබුණු බව සනාථ කරමින් අනන්‍ය යොමුගත අංකයක් නිකුත් කළ යුතු අතර, අයදුම්පත සම්බන්ධිත ඉදිරි සියලු සන්නිවේදන කාර්යන්හි දී එකී යොමුගත අංකය භාවිතා කළ යුතු ය.

30. අදාළ අංශය විසින්, අවශ්‍ය වේ නම්, යෝග්‍ය යැයි හැඟෙන පරිදි රේගු පෙරගත නියමයක් සඳහා ඉදිරිපත් කළ කරුණ කඩිනමින් නිර්ණය කිරීමට පහසුකම් සැලැස්වෙන පරිද්දෙන් පුද්ගලිකව පැමිණ හෝ වෙනත් සුදුසු ආකාරයක සන්නිවේදන ක්‍රමයක් ඔස්සේ අයදුම්කරු සහ/ හෝ බලයලත් නියෝජිත වෙතින් යම් පැහැදිලි කිරීමක් හෝ සත්‍යාපනය කිරීමක් ඇතුළුව අතිරේක තොරතුරු ඉල්ලුම් කළ හැකි ය. අයදුම්කරුට ප්‍රතිචාර දැක්වීම සඳහා සතියේ වැඩ කරන දින පහකට (05) නොඅඩු කාල සීමාවක් වෙත ලබාදිය යුතු ය.

31. අයදුම්කරු/ බලයලත් නියෝජිත විසින් අවශ්‍ය සියලු තොරතුරු ඉදිරිපත් කිරීමට යටත්ව, නියමිත පරිදි සම්පූර්ණ කළ අයදුම්පතක් සඳහා අයදුම්පත ඉදිරිපත් කළ දිනයේ සිට දින අනූවක (90) කාලසීමාවක් ඇතුළත අදාළ අංශය විසින් රේගු පෙරගත නියමයන් නිකුත් කළ යුතු අතර, අයදුම්කරු/ බලයලත් නියෝජිත වෙත එකී නියමයන් ලිඛිතව දැනුම් දිය යුතු වන අතර රේගු නියමයන් පිළිබඳ දත්ත සමුදාය තුළ එය පැවතිය යුතු ය. අයදුම්කරු බලයලත් ආර්ථික මෙහෙයුම්කරුවෙකු (AEO) වන අවස්ථාවක දී පෙරගත නියමය දින හැටක් (60) ඇතුළත නිකුත් කළ යුතු ය.

32. අතිරේක තොරතුරු, ලේඛන හෝ පැහැදිලි කිරීමක් සඳහා රේගුව විසින් ඉල්ලීමක් සිදුකරන අවස්ථාවක දී, බලයලත් ආර්ථික මෙහෙයුම්කරුවෙකු (AEO) සඳහා නියම කර ඇති දින හැටක (60) කාල සීමාව සහ අනෙකුත් අස්තිත්වයන් සඳහා නියම කර ඇති දින අනූවක (90) කාල සීමාව එවැනි ඉල්ලීමක් සිදුකරන අවස්ථාවේ සිට අත්හිටුවනු ලැබිය යුතුය. එකී කාල සීමාව ගණනය කිරීම නැවත ආරම්භ වනුයේ අවශ්‍ය පරිදි සම්පූර්ණ තොරතුරු, ලේඛන හෝ පැහැදිලි කිරීම් ලැබෙන අවස්ථාවේ සිට ය.

33. නිකුත් කරනු ලබන රේගු පෙරගත නියමයන් ඔස්සේ ඉදිරිපත් කරන ලද ගැටලුවට හැකිතාක් නිරවද්‍ය ආකාරයෙන් පිළිතුරු ලබාදිය යුතු ය. *නිදසුනක් ලෙස, වෙළඳ භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධිත නියමයක් අදාළ වනවිට, එය අංක අටකින් (08) කින් යුතු සංයෝජිත වර්ගීකරණ සංකේතාංක පදනම මත නිකුත් කළ යුතු ය; ප්‍රභවස්ථානය (ආනයන) පිළිබඳ නියමයකින් ඇතිවන ගැටලු සහගත තත්ත්වයක් නම් එම භාණ්ඩ අදාළ ගිවිසුම යටතේ වන ප්‍රභවස්ථාන අවශ්‍යතාවය සම්පූර්ණ කරන්නේ ද යන ගැටලුවට පිළිතුරක් ලබා දිය යුතු ය; යොමුගත සංරචකය රේගු වටිනාකමේ කොටසක් ද හෝ නැත් ද යන ගැටලුවට විසඳුමක් රේගු මිල පිරික්සුම් පිළිබඳ නියමයක් මගින් ඉදිරිපත් විය යුතු ය.*

34. සංයෝජිත වර්ගීකරණ ක්‍රමය අර්ථ නිරූපණය කිරීමේ පොදු රීති යටතේ දක්වා ඇති මූලධර්ම මත වෙළඳ භාණ්ඩ වර්ගීකරණය පාලනය විය යුතු ය. මෙම කාර්යය සඳහා සංයෝජිත වර්ගීකරණ ක්‍රමය සඳහා වන සවිස්තරණ සටහන් සලකා බැලීම ද අවශ්‍ය වේ.

රේගු පෙරගත නියමයන් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ කල් දැමීම

35. අයදුම්කරු/ බලයලත් නියෝජිත විසින් නියෝග 30 යටතේ දක්වා ඇති වැඩිදුර තොරතුරු, එවැනි ඉල්ලීමක් සිදුකළ දිනයේ සිට දින තිහක් (30) ඇතුළත කිසිදු පිළිගත් හේතුවක් රහිතව ලබාදීමට අපොහොසත්වීම මගින් රේගු පෙරගත නියමයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

36. අයදුම්කරු/ බලයලත් නියෝජිත විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය හෝ එකී අයදුම්කරු විසින්ම ශ්‍රී ලංකා රේගුවේ යම් නිලධාරියෙකු, වෙනත් ඕනෑම රජයේ නියෝජිතායතනයක් හෝ අභියාචනා විනිශ්චයාධිකාරයක් හෝ අධිකරණයක් වෙත මීට

පෙර ලබාදී ඇති තොරතුරුවලට පටහැනි බවට පෙනී ගියහොත් රේගු පෙරගත නියමයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ නියමයක් නිකුත් කිරීම ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප විය හැකි ය.

37. අයදුම්පතෙහි දක්වා ඇති ගැටලුව මේ වන විටත් විසඳා ඇති හෝ අභියාචනා විනිශ්චයාධිකාරයක් හෝ ඕනෑම අධිකරණයක් ඉදිරියේ තවමත් විභාග වෙමින් පවතින්නේ නම්, අයදුම්පත සම්බන්ධයෙන් කටයුතු කරන ඕනෑම අදියරයක් තුළ දී රේගු පෙරගත නියමයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

38. රේගු නියමයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සිදුකළ හොත්, අදාළ තොරතුරු සහ එකී තීරණය ගැනීමේ පදනම දක්වමින් අයදුම්කරු/ බලයයත් නියෝජිත ඒ සම්බන්ධයෙන් විද්‍යුත් මාර්ගවලින් ද ඇතුළුව ලිඛිතව දැනුවත් කළ යුතු ය.

රේගු පෙරගත නියමයන්ගේ නෛතික වලංගුභාවය

39. මෙම නියෝග යටතේ නිකුත් කරන රේගු පෙරගත නියමයකට, මෙම නියෝගවල දක්වා ඇති සමාලෝචනය සහ අභියාචනයේ විධිවිධානවලට යටත්ව අයදුම්කරු බැඳී සිටී.

40. නියමයක් සඳහා පදනම් වන ප්‍රමාණාත්මක කරුණු, තත්ත්වයන්, ගිවිසුම්ගත කොන්දේසි, සහ නෛතික විධිවිධාන අනන්‍යව පවතින තුරු පමණක් සියලු රේගු පෙරගත නියමයන් වලංගු වේ.

41. යම් අයදුම්කරුවෙකු වෙත මෙම නියෝග යටතේ නිකුත් කරනු ලැබූ රේගු පෙරගත නියමයක් එකී අයදුම්කරුට අදාළව ශ්‍රී ලංකා රේගුව සහ බලයලත් නියෝජිතයාට පමණක් බැඳී පැවතිය යුතු ය.

42. මෙම නියෝග යටතේ නිකුත් කරනු ලැබූ රේගු පෙරගත නියමයක්, මෙම රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරමින් එකී නියමය සමාලෝචනය, අවලංගු කිරීම, නිෂ්ප්‍රභා කිරීම සිදුකළහොත් මිස හෝ වසර තුනක වලංගු කාලය ඉක්මවීමට ප්‍රථමයෙන් නිසි නෛතික බලාධිකාරයක් විසින් අවංලගු කළහොත් මිස, එකී නියමය නිකුත් කළ දිනයේ සිට වසර තුනක් (03) දක්වා වලංගුව පැවතිය යුතු ය.

රේගු පෙරගත නියමයක් නිෂ්ප්‍රභා කිරීම

43. ප්‍රමාණාත්මක කරුණු යටපත් කිරීමේ සිද්ධි ද ඇතුළුව අයදුම්කරු/ බලයලත් නියෝජිත විසින් ඉදිරිපත් කළ යම් කරුණක් සාවද්‍ය හෝ හිතාමතා නොමඟ යවන සුළු ස්වභාවයකින් යුතු බව සනාථ වුවහොත් රේගු පෙරගත නියමයක් නිෂ්ප්‍රභා කළ යුතු ය.

44. නිෂ්ප්‍රභා කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සම්බන්ධයෙන් එකී ක්‍රියාවලිය ආරම්භ කිරීමට පදනම් වූ කරුණු සහ එකී නිවේදනයේ සඳහන් කර ඇති හේතුවලට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට එකී නිවේදනය සන්නිවේදනය කරනු ලැබූ දිනයේ සිට සති දෙකක කාලසීමාවක් ලබා දෙමින් අදාළ අංශය විසින් රේගු පෙරගත නියමය නිකුත් කරනු ලැබූ අයදුම්කරු/ බලයලත් නියෝජිත වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

45. 44 වැනි නියෝගය යටතේ නිවේදනය නිකුත් කළ දිනයේ සිට රේගු පෙරගත නියමයේ අදාළත්වය අත්හිටුවිය යුතුය.

46. අදාළ අංශය විසින් නිෂ්ප්‍රභා කිරීම දැනුම්දෙමින් හෝ අයදුම්කරු වෙතින් ලැබෙන පිළිතුර සලකා බලා අවස්ථාචෝචිත පරිදි විධානයක් ලිඛිතව නිකුත් කිරීම සිදුකළ යුතු ය.

47. වෙනත් ආකාරයකින් සඳහන් කර නැතොත්, රේගු පෙරගත නියමයක් නිෂ්ප්‍රභා කිරීමේ විධානයක් එකී නියමය නිකුත් කළ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

48. නිෂ්ප්‍රභා කිරීමේ විධානය නිකුත් කිරීමෙන් අනතුරුව, අදාළ පරිදි දණ්ඩන ප්‍රතිඵල ද සමඟින් බදු ආපසු අයකර ගැනීම හෝ ප්‍රතිලාභ නොමැති බව පළකර සිටීම ඇතුළු ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතු ය.

පෙරගත නියමයන් වෙනස් කිරීම, අහෝසි කිරීම හෝ අවලංගු කිරීම

49. දේශීය නීතිවල සිදුවන වෙනස්වීම්, හෝ ලෝක රේගු සංවිධානය විසින් ගනු ලබන තීරණ හෝ නියමයන් හේතුවෙන් සිදුවන වෙනස්වීම් හෝ දැනට පවතින වෙළඳ ගිවිසුමක බලාත්මක තත්ත්වයේ වෙනස්වීමක් හෝ නව ගිවිසුමක් බලාත්මකවීම වැනි කරුණු මත රේගු පෙරගත නියමයක් අවලංගුවීම, අහෝසි කිරීම හෝ වෙනස් කිරීමක් විය හැකි ය.

50. අදාළ අංශයට සිය අභිමතය පරිදි හෝ අයදුම්කරු/ බලයලත් නියෝජිත විසින් සිදුකරන ලිඛිත ඉල්ලීමක් මත 49 වැනි නියෝගය යටතේ ක්‍රියාමාර්ගයක් ආරම්භ කළ හැකි ය.

51. අභිමතානුසාරීව අවලංගු කිරීමේ, අහෝසි කිරීමේ හෝ වෙනස් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇති අවස්ථාවක දී, රේගු පෙරගත නියමය සඳහා යෝජිත අවලංගු කිරීම, අහෝසි කිරීම හෝ වෙනස් කිරීම සඳහා වන හේතු ලිඛිතව අදාළ අයදුම්කරු/ බලයලත් නියෝජිත වෙත දැනුම් දිය යුතු අතර නිවේදනය සඳහා ප්‍රතිචාර දැක්වීමට සතියක කාල සීමාවක් ද ලබාදිය යුතු ය.

52. එකී අවලංගු කිරීම, අහෝසි කිරීම හෝ වෙනස් කිරීම සඳහා පදනම ද විස්තර කරමින් රේගු පෙරගත නියමය සඳහා අවලංගු කිරීම, අහෝසි කිරීම හෝ වෙනස් කිරීම සම්බන්ධයෙන් දැනුම් දීම සඳහා අදාළ අංශය විසින් ලිඛිත විධානයක් නිකුත් කළ යුතු ය.

53. වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති නම්, අදාළ හේතු ද ඇතුළත්ව 52 වැනි නියෝගය යටතේ නිකුත් කරන විධානයක්, මුල් පෙරගත නියමය නිකුත් කරන දිනයේ සිට නොව එකී විධානය නිකුත් කරන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

54. කිසිදු රේගු පෙරගත නියමයක් එය නිකුත් කරන දිනයට පූර්වයෙන් සිදුකළ ආනයන සහ අපනයන සඳහා අතීතයේ සිට බලාත්මක වන පරිදි අදාළ කර නොගත යුතු ය.

රේගු පෙරගත නියමයන් සමාලෝචනය කිරීම

55. රේගු පෙරගත නියමයක් ඉල්ලුම් කර ලැබූ, එහි නිවේදනය කර ඇති තීරණය සම්බන්ධයෙන් තෘප්තිමත් නොවන අයදුම්කරුවෙකු විසින් එකී රේගු පෙරගත නියමය නිකුත් කළ දිනයේ සිට දින තිහක් (30) ඇතුළත යම් අතිරේක සනාථ කිරීමේ ලේඛන ද සමඟින් සමාලෝචනය කිරීමේ ඉල්ලීම සඳහා හේතු ද නිශ්චිතව දක්වමින් සෘජුවම හෝ බලයලත් නියෝජිතයෙකු හරහා පෙරගත නියමය සමාලෝචනය කිරීම සඳහා අදාළ අංශය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදුකළ හැකි ය.

56. යථෝක්ත 55 වැනි නියෝගය යටතේ සමාලෝචනය සඳහා වන සෑම ඉල්ලීමක්ම අදාළ අංශය විසින් පරීක්ෂා කළ යුතු අතර, සමාලෝචනය සඳහා වූ ඉල්ලීම ලැබූ දිනයේ සිට දින තිහක් (30) ඇතුළත සමාලෝචිත තීරණය නිකුත් කළ යුතු ය.

57. එකී නිශ්චය කළ දින තිහක (30) කාල සීමාව තුළ සමාලෝචන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට අදාළ අංශය විසින් අපොහොසත් වන අවස්ථාවක දී, සමාලෝචිත තීරණය නිකුත් කිරීම සඳහා අවශ්‍ය විය හැකි සතියේ වැඩකරන දින පහක් (05) නොඉක්මවන අතිරේක කාලසීමාවක් ලබාගැනීම සම්බන්ධයෙන් අයදුම්කරු දැනුවත් කළ යුතු ය.

රේගු පෙරගත නියමයන්ගේ තීරණ සම්බන්ධයෙන් අභියාචනා කිරීම

58. ඉල්ලුම් කර ලබාගත් රේගු පෙරගත නියමයක් සහ/ හෝ සාමලෝචිත විධානයක් ලැබී ඇති සහ ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් නොවන අයදුම්කරුවෙකු විසින් එකී පෙරගත නීයමයට සහ/ හෝ සමාලෝචිත විධානයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

59. කොළඹ 11, කෙළින් වීදියේ අංක 40 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා රේගු මූලස්ථානයේ රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව අභියාචනය ඉදිරිපත් කළ යුතු ය. පහත දක්වා ඇති පරිදි රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් එවැනි අභියාචනා අදාළ අභියාචනා මණ්ඩල වෙත යොමු කළ යුතු ය.

(i) වෙළඳ භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධිත රේගු පෙරගත නියමයන් සඳහා නාමකරණ සහ වර්ගීකරණ කමිටුව ("NC කමිටුව" ලෙස හැඳින්වෙන).

(ii) ආනයනය කළ හැකි භාණ්ඩ සම්බන්ධිත රේගු පෙරගත නියමයන් සඳහා ප්‍රභවස්ථාන රීති පිළිබඳ තාක්ෂණ කමිටුව ("TCRO" ලෙස හැඳින්වෙන)

(iii) මිල පිරික්සුම් සම්බන්ධිත රේගු පෙරගත නියමයන් සඳහා රේගු මිල පිරික්සුම් පිළිබඳ තාක්ෂණ කමිටුව ("TCCV" ලෙස හැඳින්වෙන)

60. නියමයක් සහ/හෝ 56 වැනි නියෝගයේ දක්වා ඇති පරිදි සමාලෝචිත තීරණයක් නිකුත් කළ දිනයේ සිට දින තිහක් (30) ඇතුළත එවැනි අභියාචනයක් ඉදිරිපත් කළ යුතු අතර අභියාචනය සනාථ කිරීම සඳහා උපකාරී වන සියලු ලිපිලේඛන ද සමඟ අභියාචනය සඳහා හේතු ඉදිරිපත් කළ යුතු ය.

61. 60 වැනි නියෝගයේ දක්වා ඇති පරිදි වන සෑම අභියාචනයක්ම අදාළ අභියාචනා මණ්ඩලය විසින් පරීක්ෂා කළ යුතු අතර අයදුම්කරු/ බලයලත් නියෝජිත වෙත අභියාචනා පිළිබඳ රේගු පෙරගත නියමයක් බලයලත් ආර්ථික මෙහෙයුම්කරුවෙකු නම් අභියාචනය ලැබූ දිනයේ සිට දින හැටක් (60) ඇතුළත ද අනෙකුත් අස්තිත්ව සඳහා දින අනූවක් (90) ඇතුළත ද වශයෙන් ලිඛිතව නිකුත් කළ යුතු ය.

62. අභියාචනා කමිටුව විසින් අතිරේක තොරතුරු හෝ ලේඛන ඉල්ලා සිටිය හැකි අතර, අභියාචනා සම්බන්ධිත රේගු පෙරගත නියමයන් නිකුත් කිරීමට පෙර පුද්ගලිකව පැමිණ සිය නියෝජනය ඉදිරිපත් කිරීම සඳහා අගතියට පත් පාර්ශවයට සාධාරණ අවස්ථාවක් ලබාදිය යුතු ය.

63. කාල දිගුවක් හෝ අත්හැර දැමීමක් ලබානොගන අයදුම්කරු හෝ බලයලත් නියෝජිත විසින් අදාළ අභියාචනා මණ්ඩලය වෙත අවශ්‍ය කරන තොරතුරු, ලේඛන හෝ පැහැදිලි කිරීම් ලබාදීමට අපොහොසත් වීමේ දී සහ පුද්ගලිකව සහභාගීවීමට අපොහොසත් වීමේදී බලයලත් ආර්ථික මෙහෙයුම්කරුවෙකු නම් අභියාචනය ලැබූ දිනයේ සිට දින හැටක් (60) ඇතුළත ද අනෙකුත් අස්තිත්ව සඳහා දින අනූවක් (90) ඇතුළත ද වශයෙන් ලබාදී ඇති නියමිත කාල සීමාව එකී ඉල්ලීම සිදුකළ දිනයේ සිට අත්හිටවනු ලැබිය යුතු ය. අදාළ කාල සීමාව ගණනය කිරීම නැවත ආරම්භ වනුයේ අවශ්‍ය පරිදි සම්පූර්ණ තොරතුරු, ලේඛන හෝ පැහැදිලි කිරීම් ලැබෙන දිනයේ සිට පමණි.

64. පිළිගත හැකි හේතුවකින් තොරව ඉල්ලීමක් ඉදිරිපත් කර දින තිහක් (30) ඇතුළත 63 වැනි නියෝගයේ දක්වා ඇති කාල සීමාව තුළ අයදුම්කරු/ බලය ලත් නියෝජිත විසින් අතිරේක තොරතුරු ලබාදීමට අපොහොසත්වීම ඔස්සේ රේගු පෙරගත නියමයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

65. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසාන අනුමැතියට යටත්ව, අභියාචනා මණ්ඩලයේ තීරණය ප්‍රකාශ කිරීම/ දැනුම් දීම අදාළ මණ්ඩලයේ ලේකම්වරයාගේ වගකීම වේ. අවශ්‍ය යැයි හැඟුනහොත් ලෝක රේගු සංවිධානය ද ඇතුළුව පුද්ගලයන්, විශේෂඥවරු හෝ වෘත්තිකයන් වෙතින් තවදුරටත් සහාය හෝ උපදෙස් හෝ මඟ පෙන්වීම ඉල්ලා සිටීම සඳහා වන අභිමතය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු ය.

අදාළ අභියාචනා මණ්ඩලය වෙතින් ලැබෙන තීරණය සඳහා නැවත අභියාචනා කිරීම

66. අදාළ අභියාචනා මණ්ඩලයක් වෙතින් තීරණයක් ඉල්ලුම් කර එය ලැබී ඇති අයදුම්කරුවෙකුට එසේ දැන්වූ තීරණයෙන් තෘප්තිමත් වී නොමැති නම්, එකී තීරණය නිකුත් කළ දිනයේ සිට දින තිහක් (30) ඇතුළත සියලු සනාථ කරන ලේඛන සමඟින් සෘජුවම හෝ බලයලත් නියෝජිතවරයෙකු හරහා අභියාචනා මණ්ඩලයේ තීරණය සමාලෝචනය කිරීම සඳහා වන ඉල්ලීමක් එකී ඉල්ලීම සඳහා වන හේතු දක්වමින් ලිඛිත ආකාරයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ හැකි ය.

67. යථෝක්ත 66 වැනි නියෝගය යටතේ වන නැවත අභියාචනය කිරීම සඳහා වන සෑම ඉල්ලීමක්ම අදාළ අභියාචනා මණ්ඩලය විසින් පරීක්ෂා කළ යුතු අතර, නැවත අභියාචනා කිරීම සඳහා වන ඉල්ලීම ලැබූ දිනයේ සිට දින තිහක් (30) ඇතුළත තීරණය නිකුත් කළ යුතු ය.

68. නිශ්චිතව දක්වා ඇති දින තිහක (30) කාල සීමාව තුළ නැවත අභියාචනය කිරීම සම්බන්ධිත ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට අදාළ අභියාචනා මණ්ඩලයට නොහැකි වන අවස්ථාවක දී, නැවත අභියාචනය සම්බන්ධිත තීරණය නිකුත් කිරීම සඳහා අවශ්‍ය විය හැකි දින පහළොවක් (15) නොඉක්මවන කාල සීමාවක අතිරේක දින ලබාගැනීම සම්බන්ධයෙන් අයදුම්කරු දැනුවත් කළ යුතු ය.

ගාස්තු ගෙවීම

69. රේගු පෙරගත නියමයක් ලබාගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවෙකු විසින් ඒ සඳහා වන සෑම අයදුම්පත්‍රයක්ම ඉදිරිපත් කරන අවස්ථාවේ දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තුවක් පහත පරිදි ගෙවිය යුතු ය.

අ. දේශීය අස්තිත්වයක් සඳහා - රු. 15,000/-

ආ. විදේශීය අස්තිත්වයක් සඳහා - රු. 30,000/-

70. රේගු පෙරගත නියමයකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවෙකු විසින් ඒ සඳහා වන සෑම අයදුම්පත්‍රයක්ම ඉදිරිපත් කරන අවස්ථාවේ දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ආපසු නොගෙවන අභියාචනා ගාස්තුවක් පහත පරිදි ගෙවිය යුතු ය.

අ. දේශීය අස්තිත්වයක් සඳහා - රු. 10,000/-

ආ. විදේශීය අස්තිත්වයක් සඳහා - රු. 20,000/-

71. මෙම නියෝග යටතේ අයකරනු ලබන සහ එකතු කරනු ලබන සියලුම ගාස්තු ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

72. යම් භාණ්ඩයක්/ ගනුදෙනුවක් සම්බන්ධයෙන් රේගු පෙරගත නියමයක් ලබාගැනීම සඳහා වන අයදුම්පතක් සලකා බැලීම සඳහා වැඩිදුරටත් විශ්ලේෂණ වාර්තා හෝ විශේෂඥවරු එක් අයකුගේ හෝ වැඩි පිරිසකගේ මතය ලබාගැනීමට අදාළ අංශය විසින් තීරණය කළ හැකි අතර, පරීක්ෂණාගාර වාර්තා, රේගුව විසින් බලය පැවරූ නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ සාම්පල යැවීම සඳහා වන ගාස්තු යනාදී වශයෙන් වූ ගාස්තු අය කිරීම සඳහා අදාළ අංශය විසින් දන්වා සිටින අවස්ථාවේ දී එය අයදුම්කරු විසින් දැරිය යුතු ය

ප්‍රකාශනය සහ රහස්‍යභාවය

73. රේගු පෙරගත නියමයන් සඳහා වූ උපලේඛන I, II සහ III යටතේ දක්වා ඇති අයදුම්පත් ආකෘතිවල අයදුම්කරු/ බලයලත් නියෝජිතවරයා විසින් "රහසිගත" වශයෙන් ලබාදෙන සියලු තොරතුරු, අදාළ අංශය විසින් ඉතා රහසිගත වශයෙන් සැලකිය යුතු අතර, රේගු විමර්ශනයක් හෝ අධිකරණ ක්‍රියාවලියක් වැනි සංදර්භයක් තුළ අනාවරණය කිරීම අවශ්‍ය වුවහොත් හැර, එවැනි රහසිගත තොරතුරු එකී තොරතුරු ලබාදෙන අයදුම්කරුගේ විශේෂිත අවසරය රහිතව අනාවරණය නොකළ යුතු ය.

74. 73 වැනි නියෝගයේ විධිවිධානවලට යටත්ව, අනෙකුත් පාර්ශව සඳහා සැලකිය යුතු ප්‍රයෝජනයක් සැලසෙන රේගු පෙරගත නියමයන්, සමාලෝචන විධාන සහ අභියාචනා තීරණ රේගු නියමයන් පිළිබඳ දත්ත සමුදාය තුළ ප්‍රසිද්ධියට පත්කළ යුතු ය.

75. සියලුම රේගු පෙරගත නියමයන් වරින් වර සංශෝධනයට ලක්වී ඇති (235 වැනි අධිකාරිය) වන රේගු ආඥා පනතේ උපලේඛන අ හෝ උපලේඛන ඉ සඳහා අදාළ වන කොටසක් ලෙස ගැසට් පත්‍රයේ පළ කරන රීතිවලට අනුකූල විය යුතු අතර, එවැනි නියමයන් වලංගුව පැවති කාල සීමාව තුළ සිදුකරන ලද කිසිදු කාර්යයකට අගතියක් නොවන පරිදි, නීති ප්‍රකාරව එකී නියමයන් අවලංගු කරන තුරු බලාත්මකව පැවතිය යුතු ය.

76. මෙම නියෝග යටතේ වංචාකාරී, නොමඟ යවන සුළු සහ/ හෝ සාවද්‍ය තොරතුරු සපයන අයදුම්කරුවන් සහ/ හෝ බලයලත් නියෝජිතවරු සම්බන්ධයෙන් සංශෝධිත (235 වැනි අධිකාරිය) වන රේගු ආඥා පනතේ සහ අදාළ නීතිවල විධිවිධාන යටතේ කටයුතු කළ යුතු ය.

උපලේඛනය I

ACC -01

ශ්‍රී ලංකා රේගුව **පෙරගත වර්ගීකරණ නියමය සඳහා අයදුම්පත්‍රය** **(APPLICATION FOR ADVANCE CLASSIFICATION RULING)**	කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි. **අයදුම්පත් අංකය: CC / AR / 20…. / ……** **භාරගත් දිනය:**
1.) අයදුම්කරුගේ විස්තර	

අ. නම/ සමාගමේ නම සහ ලිපිනය						
ආ. ආනයනකරු/ අපනයනකරු / වෙනත්, ලියාපදිංචි අංකය (TIN/ VAT/ ජාතික හැඳුනුම්පත් අංකය)	ආනයනකරු		අපනයනකරු		වෙනත්	
	TIN/ VAT/ ජාතික හැඳුනුම්පත් අංකය					
2.) භාණ්ඩය පිළිබඳ විස්තර						
අ. භාණ්ඩයේ සම්පූර්ණ වෙළඳ විස්තරය පොදු නම/ සන්නාමය/ මාදිලිය/ පරිමාව/ මිම්ම/සංයුතිය /අලුත්ම හෝ භාවිතා කර ඇති, ආදි වශයෙන් (අදාළතාවය අනුව)						
ආ. ඉදිරිපත් කළ නියැදියේ විස්තර හා ඒ පිළිබඳ අදාළ තොරතුරු (අදාළ පරිදි මෙම සලකුණ යෙදීම "√" සහ පසු පිටෙහි ස්කෑන් කරන ලද පැහැදිලි ඡායාරූපයක්/ රූපයක් අලවන්න)	නියැදි		තාක්ෂණික දත්ත පත්‍රිකාව (TDS)		ඡායාරූප	
	නිෂ්පාදන ක්‍රියාවලිය		ද්‍රව්‍යවල සෞඛ්‍යාරක්ෂිත බව සම්බන්ධයෙන් දත්ත පත්‍රිකාව (MSDS)		සැලැස්ම (පිහිටීම, බිම)	
	අන්තර්ගත ද්‍රව්‍යවල සංයුතිය		විශ්ලේෂණ වාර්තාව		නිෂ්පාදනාගාර වාර්තාව	
* අයදුම්කරු විසින් සියලුම ලේඛන සහතික කළ යුතු ය.	භාණ්ඩ නාමාවලි		වෙනත්			
ඇ. අපේක්ෂිත භාවිතය						
ඈ. මෙම භාණ්ඩය කුමන ස්වරූපයෙන් (form) ආනයනය/ අපනයනය කෙරේ ද?						
3.) භාණ්ඩය සම්බන්ධ රහස්‍ය තොරතුරු ("ඔව්" නම්, විස්තර සපයන්න)						
4.) මීට පෙර යම් වර්ගීකරණ උපදෙසක් රේගුවෙන් ලබාගෙන තිබේ ද හෝ මෙම භාණ්ඩය රේගුව හෝ වෙනත් රජයේ ආයතනයක් හෝ අධිකරණයේ විමර්ශනයකට, අභියාචනයකට හෝ වෙනත් යම් සමාලෝචනයකට අදාළ වේ ද? ("ඔව්" නම්, විස්තර සපයන්න)						
5.) නිෂ්පාදකයාගේ හෝ සැපයුම්කරුගේ නම, ලිපිනය හා වෙබ් අඩවිය						
6.) අයදුම්කරුගේ මතය අනුව සංයෝජිත වර්ගීකරණ කේතය (HS Code) සහ ඒ සම්බන්ධයෙන් හේතු						
7.) මෙම භාණ්ඩය සඳහා මීට පෙර පෙරගත නියමයක් හෝ තීරණයක් ලබාගෙන තිබේ ද? "ඔව්" නම්, යොමු අංකය සහ සංයෝජිත වර්ගීකරණ කේතය (HS Code) සඳහන් කරන්න						
8.) සම්බන්ධ කරගත හැකි තැනැත්තාගේ නම, විද්‍යුත් තැපැල් ලිපිනය සහ ජංගම දුරකතන අංකය						

9.) මෙම ආකෘතිය සහ ඕනෑම ඇමුණුමක ඇති සියලුම තොරතුරු සහ ප්‍රකාශ මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය, නිවැරදි සහ සම්පූර්ණ බවට සහ මෙම අයදුම්පතට අදාළ නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් මම දැනුවත් බවට සහතික කරමි/ දිවුරා ප්‍රකාශ කරමි.

අයදුම්කරුගේ නම සහ සම්බන්ධ කරගැනීම සඳහා විස්තර:

විද්‍යුත් තැපැල් ලිපිනය :

අත්සන සහ නිල මුද්‍රාව : දිනය :

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි</u> **සංශෝධනය හෝ අවලංගු කිරීමක් සිදු නොකළහොත්, රේගු පෙරගත නියමය එය නිකුත් කළ දිනයේ සිට මාස තිස් හයක් (36) සඳහා වලංගු වේ.**	
1.) රේගුව සඳහා මුදල් ගෙවූ රිසිට් පතෙහි අංකය:	දිනය:
2.) වඩාත් ගැලපෙන සංයෝජිත වර්ගීකරණ කේතය (HS Code):	
3.) ප්‍රකාශය: **මෙම පෙරගත නියමය වලංගු වනුයේ ඉහත විස්තර කළ භාණ්ඩය සඳහා පමණි.**	
4.) නිකුත් කළ දිනය: **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ** **(භාණ්ඩ වර්ගීකරණ අංශය)**	**අ/කළේ. රේගු අධ්‍යක්ෂ (විශේෂිත සේවා)** **රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට**

වර්ණ ඡායාරූපය සහ අනෙකුත් අදාළ විස්තර

අයදුම්කරුගේ අත්සන සහ මුද්‍රාව :

දිනය. :

උපලේඛනය II

ARRO-01

ශ්‍රී ලංකා රේගුව

ප්‍රභවස්ථාන ගැටලු
සම්බන්ධයෙන් පෙරගත නියමයන් (ආනයන)

(1) අයදුම්කරුගේ නම

(2) අයදුම්කරුගේ ලිපිනය

(3) බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය

(4) අයදුම්කරුගේ තත්ත්වය

ආනයනකරු ☐ අනුයෝජිත ☐ තැරුව්කරු ☐ අපනයනකරු ☐ නිෂ්පාදක ☐ වෙනත් ☐

(වෙනත් කාණ්ඩයකට අයත් වේ නම්, කරුණාකර එය නිශ්චිතව සඳහන් කරන්න ....)

(5) නිෂ්පාදිතය පිළිබඳ විස්තරය

(6) නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු
නිෂ්පාදිතයේ නම:
වාණිජමය විස්තරය:
යෝජිත සංයෝජිත වර්ගීකරණ කේතය:
ආකෘතිය/ වර්ගය/ මාදිලිය:
අපේක්ෂිත භාවිතය:
පත්‍රිකා අමුණා තිබේ ද යන්න: ----------------------- ☐ ඔව් ☐ නැත

(1) නිෂ්පාදන/ නිමැවුම් ක්‍රියාවලිය
ක්‍රියාවලිය පිළිබඳ විස්තරය:
ගැලීම් සටහන අමුණා තිබේද යන්න ----------------------- ☐ ඔව් ☐ නැත
ස්ථානය:

(8) ද්‍රව්‍ය/ යෙදවුම්වල ප්‍රභවය

ද්‍රව්‍ය ලේඛනය (විස්තරාත්මක පත්‍රිකාවක් අමුණන්න)				
ද්‍රව්‍ය/ යෙදවුම්	සංයෝජිත වර්ගීකරණ කේතය	ප්‍රභවස්ථාන රට	අගය %	නිෂ්පාදන ක්‍රියාවලිය තුළ කාර්යය

(9) අදාළ වන්නා වූ හිමිකම් ඉල්ලා සිටින ප්‍රභවස්ථාන රීතිය

ප්‍රභවස්ථාන වර්ගය: ☐ වරණීය ☐ වරණීය නොවන

ගිවිසුම්/ යෝජනා ක්‍රමය :

හිමිකම් ඉල්ලා සිටින රීතිය: ☐ පූර්ණ වශයෙන් ලබා ඇත. ☐ අනෙකුත්

හිමිකම සහ සාධාරණීකරණය:

(10) ඉදිරිපත් කරන ලේඛන

- ☐ වාණිජ ඉන්වොයිසය (ඉන්වොයිස්)
- ☐ නිෂ්පාදන ගැලීම් සටහන
- ☐ ද්‍රව්‍ය ලේඛනය (නැව්ගත කරන තෙක් වටිනාකම)
- ☐ ආනයන/ අපනයන වාර්තා
- ☐ සැපයුම්කරුවන්ගේ ප්‍රකාශ
- ☐ තාක්ෂණ පිරිවිතර/ නාමාවලි
- ☐ මීට පෙර ලබාගෙන ඇති නියමයන් (ඇතොත්)
- ☐ අනෙකුත්

(11) අතිරේක තොරතුරු

(12) ඔබ විසින් මීට පෙර මෙයම හෝ මීට සමාන පෙරගත නියමයක් සඳහා අයදුම් කර තිබේ ද?

ඔව් ☐ නැහැ ☐

ඔව් නම්, කරුණාකර තොරතුරු සපයන්න.
……

(13) මෙයම හෝ මීට සමාන ගැටලු සම්බන්ධයෙන් යම් පෙරගත නියමයන් නිකුත් කර පවතී ද යන්න සම්බන්ධයෙන් ඔබ දැනුවත් ද?

ඔව් ☐ නැහැ ☐

පිළිතුර ඔව් නම්, කරුණාකර තොරතුරු සපයන්න.

....

(14) ඔබගේ දැනුමට අනුව නියමයක් අපේක්ෂා කරන මෙම ගැටලුව, රජයේ නියෝජිතායතනයක්, අභියාචනා විනිශ්චය සභාවක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ විභාග වෙමින් පවතී ද?

ඔව් ☐ නැත ☐

ඔව් නම්, කරුණාකර තොරතුරු සපයන්න.

....

(15) ඔබගේ හිමිකම විශ්ලේෂණය කරන්න.

සම්බන්ධ කරගත යුතු තැනැත්තාගේ පුද්ගලික තොරතුරු

(16) සම්බන්ධ කරගත හැකි තැනැත්තා	
(17) තනතුර	

	ජංගම දුරකතන අංකය	කාර්යාලීය දුරකතන අංකය	විද්‍යුත් තැපැල් ලිපිනය
(18) සම්බන්ධ කරගැනීම සඳහා තොරතුරු			

සහතික කිරීම

(19) අධ්‍යක්ෂ/ අයිතිකරු/ පාර්ශ්වකරුගේ නම	

මෙම ආකෘතිය සහ ඕනෑම ඇමුණුමක ඇති සියලුම තොරතුරු සහ ප්‍රකාශ මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය, නිවැරදි සහ සම්පූර්ණ බව සහතික කරමි/ දිවුරා ප්‍රකාශ කරමි.

(අත්සන සහ දිනය)	(නිල මුද්‍රාව)
ලැබුණු දිනය	නිකුත් කළ දිනය

යොමු අංකය :

ඕනෑම කොටසක් සඳහා අතිරේක ඉඩකඩ අවශ්‍ය වේ නම්, අතිරේක කොළයක් ඇමිණිය හැකි ය. පැහැදිලිතාවය සඳහා අදාළ වන කොටස ඇමුණුමෙහි දක්වන්න.

---

(20) රේගුවේ ප්‍රයෝජනය සඳහා පමණි.

අයදුම්පත් අංකය:

ලැබුණු දිනය:

කාර්යය පවරනු ලැබූ නිලධාරියා:

පරීක්ෂා කළ ලේඛන:

අවශ්‍ය අතිරේක ලේඛන:

නියමය ලබා දීම සඳහා නියම කර ඇති අවසාන දිනය:

විශේෂ කරුණු:

උපලේඛනය III

ARRO-01

ශ්‍රී ලංකා රේගුව

රේගු මිල පිරික්සුම් සම්බන්ධයෙන් පෙරගත නියමයක් සඳහා අයදුම්පත

(1) අයදුම්කරුගේ නම

(2) අයදුම්කරුගේ ලිපිනය

(3) බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය

(4) අයදුම්කරුගේ තත්ත්වය ☐ ආනයනකරු ☐ අනුයෝජිත ☐ තැරැව්කරු ☐

(වෙනත් කාණ්ඩයකට අයත් වේ නම්, කරුණාකර එය නිශ්චිතව සඳහන් කරන්න
....)

(5). භාණ්ඩ පිළිබඳ විස්තරය

(6). නියමය ඉල්ලුම් කරන්නේ කුමක් සඳහා ද යන්න

තක්සේරු ක්‍රමය ☐ කොමිස් ☐ සහාය ☐ කර්තෘභාග සහ බලපත්‍ර ගාස්තු ☐ විකුණුම්කරු සඳහා ආදායම ☐ වෙනත් ☐

(වෙනත් කාණ්ඩයකට අයත් වේ නම්, කරුණාකර එය නිශ්චිතව සඳහන් කරන්න
....)

(7). රේගු ආඥා පනතේ ඉ උපලේඛනයේ 9 වැනි වගන්තියේ අර්ථ දක්වා ඇති පරිද්දෙන් ගැනුම්කරු සහ විකුණුම්කරු "සම්බන්ධිත" ද? ඔව් ☐ නැහැ ☐

පිළිතුර ඔව් නම්, කරුණාකර විස්තර සපයන්න සහ අදාළ වේ නම් පරීක්ෂා කිරීමේ අගයන් ලබාදෙන්න
....

(8). ගනුදෙනුව (ගනුදෙනු) පිළිබඳ විස්තරය

(9). රේගු මිල පිරික්සුම නිර්ණය කිරීම සඳහා රුකුලක් විය හැකි ඉදිරිපත් කළ ලේඛන

☐ විකුණුම් කොන්ත්‍රාත් ☐ ඉන්වොයිස් ☐ බලපත්‍ර/ කර්තෘභාග ගිවිසුම්

☐ බෙදාහැරීම්කරු/ අනුයෝජිත ගිවිසුම් ☐ කොමිස්/ තැරැව්කරු කොන්ත්‍රාත් ☐ ප්‍රවාහන ලේඛන

☐ රක්ෂණ ලේඛනය ☐ ගෙවීම් සිදුකළ බවට සහතිකය ☐ අනෙකුත්

(වෙනත් ලේඛන තිබේ නම්, විශේෂිතව දක්වන්න ……………………………………………………………………… ………………………)

(10). අතිරේක තොරතුරු

☐

(11). ඔබ විසින් මීට පෙර මෙයම හෝ මීට සමාන පෙරගත නියමයක් සඳහා අයදුම් කර තිබේ ද? ඔව් ☐ නැත ☐

(ඔව් නම්, කරුණාකර තොරතුරු සපයන්න ……………………………………………………………………………………..)

(12). මෙයම හෝ මීට සමාන ගැටලු සම්බන්ධයෙන් යම් පෙරගත නියමයන් නිකුත් කර පවතී ද යන්න සම්බන්ධයෙන් ඔබ දැනුවත් ද? ඔව් ☐ නැත ☐

(ඔව් නම්, කරුණාකර තොරතුරු සපයන්න, ...……………………………………………………………………………..

(13) ඔබගේ දැනුමට අනුව නියමයක් අපේක්ෂා කරන මෙම ගැටලුව, රජයේ නියෝජිතායතනයක්, අභියාචනා විනිශ්චය සභාවක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ විභාග වෙමින් පවතී ද? ඔව් ☐ නැත ☐

(ඔව් නම්, කරුණාකර තොරතුරු සපයන්න ……………………………………………………………………………………..)

(14). ඔබගේ මතය විශ්ලේෂණය කරන්න ;

☐

සම්බන්ධ කරගත යුතු තැනැත්තාගේ පුද්ගලික තොරතුරු;

(15). සම්බන්ධ කරගත හැකි තැනැත්තා: ☐

(16). තනතුර: ☐

(17). සම්බන්ධ කරගැනීම සඳහා: තොරතුරු	ජංගම දුරකතන අංකය	කාර්යාලීය දුරකතන අංකය	විද්‍යුත් තැපැල් ලිපිනය

සහතික කිරීම (සමාගම් පනත යටතේ සමාගම ලියාපදිංචි කර ඇත්නම් පමණි.)

(18) අධ්‍යක්ෂකගේ නම	
(19). අත්සන	
(20). නිල මුද්‍රාව සහ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය	

මෙම ආකෘතිය සහ ඕනෑම ඇමුණුමක ඇති සියලුම තොරතුරු සහ ප්‍රකාශ මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය, නිවැරදි සහ සම්පූර්ණ බව සහතික කරමි/ දිවුරා ප්‍රකාශ කරමි.

(අත්සන)	(දිනය):
ලැබුණු දිනය:	නිකුත් කළ දිනය:
යොමු අංකය:	

සටහන:
ඕනෑම කොටසක් සඳහා අතිරේක ඉඩකඩ අවශ්‍ය වේ නම්, අතිරේක කොළයක් ඇමිණිය හැකි ය. පැහැදිලිතාවය සඳහා අදාළ වන කොටස ඇමුණුමෙහි දක්වන්න.

EOG 05 - 0157

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.